# ලක්දිව පුරාණ අවමංගල්‍ය චාරිත්‍ර විධි පිළිබඳ විමර්ශනයක්

ජේ. එම්. සුධර්මාවතී

මිනිසා මේ දක්වා පසු කළ යුග තුළ ඒවාට විශේෂ වූ සංස්කෘතිකාංග දක්නට ඇත. ප්‍රාග් ඓතිහාසික මිනිසා ස්වකීය ජීවනෝපාය මුල් කර ගනිමින් උරුම කර ගත් තාක්ෂණික ඥානය පියවරෙන් පියවර වර්ධනය කර ගනිමින් සදාචාරාත්මක හා ශිෂ්ට සම්පන්න සමාජයක් කරා ගමන් කළේය. මේ සමාජ වෙනස්වීම සමඟ ක්‍රමයෙන් වර්ධනය වූ සංස්කෘතිකාංග අතර අවමංගල්‍ය චාරිත්‍රවලට ඉතා වැදගත් තැනක් හිමි වේ. මිනිසෙකු මියගිය පසු සිදු කරනු ලබන කටයුතු අවමංගල්‍ය චාරිත්‍ර ලෙස සැලකේ. මිනිස් සමාජය ක්‍රමයෙන් ශිෂ්ටසම්පන්න වීමත් සමඟ අවමංගල්‍ය විධි ක්‍රම ද කිසියම් සංවිධානාත්මක රටාවක් කරා ගමන් කරනු දැකිය හැකිය.

අවමංගල්‍ය විධි පිළිබඳ පැරණිම සංකේතය වූයේ මිසරයේ පාරාවන්ගේ පිරමීඩය යි. ඊජිප්තු වැසියන් තුළ මළවුන් සම්බන්ධව පැවති සංකල්පය වූයේ මරණින් මතු දේවත්වයට පත්වනවා යන දැඩි විශ්වාසය යි. මේ නිසා යමෙකු මියගිය පසු ඔහුගේ හෝ ඇයගේ මෘත දේහයට මෙලොවෙන් ගල්වා පරිහරණය සඳහා අවශ්‍ය භාණ්ඩ ද සමඟ මළ සිරුර තැන්පත් කිරීමට 'පිරමීඩ නමින් හැඳින්වෙන සොහොන් කොත් ' ඉදි කෙරිණි.

ක්‍රි. පූ. 3000 (2680)දී අසන් සැකාරා (saqquara) හි පිහිටි ජොසර් (Djoser) රජුගේ පාලක පිරමීඩය දැනට පවත්නා පැරණි ම පිරමීඩය යි. (Spencer, 98-99) ඊට සියවසකට පසු ව ඉදි වූ (ක්‍රි. පූ. 2580) ඛූෆු (khufu) රජුගේ ගීසාවේ පිරමීඩය ලොව විශාල ම පිරමීඩය ලෙස සැලකේ.(Spencer, 16) එමෙන් ම ක්‍රි. ව. 1922 දී ඊජිප්තුවේ කැනීම් සිදු කළ කැරනාවන් (කැනාවන්) සාමි විසින් දහ අට වන රාජවංශයට අයත් (ක්‍රි. පූ.1570-1080) ටූටන්කාමන් (Tutankhamun)ගේ සොහොන් ගැබ සොයා ගැනීම මළවුන්ගේ ආත්මය පිළිබඳ කරුණු අවබෝධ කර ගැනීම්වල තවත් වර්ධනීය අවස්ථාවකි. (Kemp,1989:219). ක්‍රි. පූ. 4000 පමණ කෙත් ඈතට දිවයන ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ මුළු සිරුර ම භූමිදානය කිරීම, මිනී කොටස් වළලෑම හා ආදාහනය කිරීම යන ක්‍රම තුන අනුගමනය කර තිබේ. මුළු සිරුර ම ආදාහනය කළ මිනී 30ක් පමණ සොයාගෙන තිබේ. කොටස් වළලෑමේ දී පළමුවෙන් ම මිනිය සතුන්ට කෑමට ඉඩ හැර පසුව හිස්කබල හා ඇටකටු එකතු කර වළ දැමීම කර තිබේ. ආදාහනයේ දී මළ සිරුර ආදාහනය කර ලබාගත් අළු හා අවශේෂ බඳුන්වල තැන්පත් කෙරිණි. (බස්නායක, 2004:17-18).